තිහගොඩ ප්‍රාදේශීය සභාව
මාතර දිස්ත්‍රික්කය

---------------------------

1 මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 දෙසැම්බර් 05 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 ජුනි 19 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජනවාරි 22 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට තිහගොඩ ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2010 ජනවාරි 19 දිනැති අංක PED/54 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ චක්‍රලේඛය අනුව 2011 ජනවාරි 01 දින සිට පළාත් පාලන ආයතන විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළයුතු වුවත් එම ප්‍රමිති අනුගමනය කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඉදිරිපත් කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සමඟ ගිණුම් පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව්කර නොතිබුණි.

1.3.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල වෙත සමාලෝචිත වර්ෂය සඳහා ගෙවිය යුතු රු.39,412 ක මුදල වියදමක් ලෙසටද වර්ෂය අවසානයට ගෙවිය යුතුව තිබූ රු.1,511,710 ක මුදල ණයහිමියන් ලෙසට ගිණුම් ගත කර නොතිබුණි.

(ආ) ඉඩම් හා ගොඩනැගිලි හතරක වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) විවිධ ණයගැති උපලේඛනය අනුව ණයගැති ශේෂ 48 ක වටිනාකම රු.82,046,918 ක් වුවද තථ්‍ය එකතුව රු.81,996,898 ක් වූයෙන් වෙනස රු.50,020 ක වෙනසක් නිරික්ෂණය විය.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාල විගණන ගාස්තු සඳහා ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ මිලට ගෙන ඇති කාර්යාල උපකරණ සහ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණද, වර්ෂය තුල ඉදිකරන ලද විවේකාගාර ගොඩනැගිල්ලද, ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත දෙකක් සඳහා ගෙවිය යුතුව තිබූ රු.449,997 ක මුදල සඳහා ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ වූ රු.45,402 ක ආයුර්වේද බෙහෙත් තොගයේ වටිනාකම පොදු ලෙජරයේ ආරම්භක ශේෂය වශයෙන් නොදක්වා නොතිබීම හේතුවෙන් වර්ෂය අවසාන තොග අගය එම ප්‍රමාණයෙන් අඩුවෙන් ගිණුම් ගතවී තිබුණි.

1.3.4 නොසැසඳූ පාලන ගිණුම්

මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් විෂයයන් 08 කට අදාල ශේෂයන්ගේ එකතුව රු.88,698,680 ක් වූ අතර උපයෝගී ලේඛන/උපලේඛන අනුව එම ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.83,013,583 ක් වූයෙන් වෙනස රු.5,685,097 ක වෙනසක් නිරික්ෂණය විය.

1.3.5 අවිනිශ්චිත ගිණුම

වර්ෂ කීපයක සිට ඉදිරියට ගෙන එමින් පවතින අවිනිශ්චිත ගිණුමේ රු.2,382,841 ක හර ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.62,909,647 ක් විය.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට වසරක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.694,252 ක් විය.

1.3.7 විගණනය සඳහා සාක්ෂි නොවීම

රු.19,329,954 ක් වටිනා ගිණුම් විෂයන් 02 ක් සම්බන්ධයෙන් සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

1.3.8 බැංකු ගිණුම්

(i) පොදු මුදල් ගිණුමට අදාලව 2013 ජුලි මාසයේ සිට බැංකු සැසඳුම් පිළියෙල කර නොතිබුණි.
(ii) 1989 අප්‍රේල් 17 දිනැති අංක 554/5 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ 5(2) හා ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 387 විධිවිධාන වලට පටහැනිව 2013 දෙසැම්බර් 31 දිනට ඉදිරියට ගෙනා අයිරාවේ වටිනාකම රු.162,542 ක් විය.

1.3.9 නීති, රීති , රෙගුලාසි ආදියට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| රීති 218 | ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකට වරක් හෝ පරීක්ෂා කිරීමට සභාපතිවරයා විසින් කටයුතු කළයුතු වුවද එසේ කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයි.ඒ.අයි.2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිසනක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,548,957 ක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,346,937 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයයන් | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| අක්කර බදු | 332 | 146 | 313 |
| කුලී | 126 | 1,270 | 326 |
| බලපත්‍ර | 826 | 493 | 53 |
| වෙනත් ආදායම් | 20,442 | 18.217 | 10,376 |

2.2.2 කඩකුලී

සමාලෝචිත වර්ෂයේ ආරම්භක හිඟ කඩ කුලී වටිනාකම රු.233,395 ක් වූ අතර වර්ෂය තුල අයකරගෙන තිබුණේ රු.108,384 ක් පමණක් වූයෙන් අයවීමේ ප්‍රගතිය සියයට 46 කි.

2.2.3 අක්කර බදු

සමාලෝචිත වර්ෂය සඳහා අක්කර බදු බිල්කිරීම් රු.2,340 ක් වූ අතර 2013 ජනවාරි 01 දිනට හිඟ ශේෂය රු.23,858 ක් විය. 2013 වර්ෂයේ බිල්කිරීම් වලින් වර්ෂය තුල ලැබුණ මුදල රු.826 ක් වූ අතර අයවීමේ ප්‍රගතිය සියයට 35 2013 ජනවාරි 01 දිනට හිඟ මුදලින් මේ වර්ෂය තුල ලද මුදල රු.4,227 ක් වූ අතර අයවීමේ ප්‍රගතිය සියයට 17 ක් තරම් සුළු අගයක් ගෙන තිබුණි.

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතුව තිබූ උසාවි දඩ හා මුද්දර ගාස්තු වල වටිනාකම රු.30,376,949 ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 මානව සම්පත් කළමනාකරණය

2013 දෙසැම්බර් 31 දිනට සභාවේ සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| තනතුරු වර්ගය | අනුමත | තථ්‍ය | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|
| විධායක | 01 | 01 | | |
| තෘතියික | 02 | 02 | | |
| ද්විතියික | 16 | 16 | | |
| ප්‍රාථමික | 21 | 19 | 02 | |
| වෙනත්(ආදේශක, අනියම්, කොන්ත්‍රාත්) | 06 | 10 | | 04 |
| | 46 | 48 | 02 | 04 |

සමාලෝචිත වර්ෂයේ පළාත් පාලන කොමසාරිස් වෙතින් කාර්යය මණ්ඩල වැටුප් හා මන්ත්‍රී දීමනා සඳහා රු.8,167,400 ක මුදලක් ප්‍රතිපූර්ණය කර තිබූ අතර වර්ෂය තුල එකී වියදම රු.11,306,854 ක් වූයෙන් රු.3,139,454 ක මුදලක් සභා අරමුදලට අතිරේක වැය බරක් වී තිබුණි.

## 4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

---

### 4.1 විගණන හා කළමනාකරණ කමිටු

---

සභාව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි.

### 4.2 අයවැය පාලනය

---

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර ඇති අයවැය ලේඛනය අනුව වු ඇස්තමේන්තුගත ආදායම් හා වියදම් වර්ෂයේ තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී විචලනයන් නිරීක්ෂණය වූ අතර ඒ අනුව අයවැය ලේඛනය ඵලදායි මූල්‍ය පාලන කාරකයක් ලෙසට යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 5. පද්ධති හා පාලන

---

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය